# හාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
## திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
## Department of Treasury Operations

තැ.පෙ 1559, මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
தபெ. 1559,பொது திறைசேரி, நிதி அமைச்சு, கொழும்பு 01, இலங்கை
P.O.Box: 1559, General Treasury, Ministry of Finance, Colombo 01. Sri Lanka

| | | | |
|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General | දුරකථන / தொலைபேசி / Telephone: +94 11 2484729 | ෆැක්ස් / பெக்ஸ் / Fax: +94 11 2431498 | ඊ-මේල් / மின் அஞ்சல் / E-mail: dgto@tod.treasury.gov.lk |
| මගේ අංකය / எனது இல / My Number: TO/REV/M2/01(ii) | ඔබේ අංකය / உமது இல / Your Number: | | දිනය / திகதி / Date: 2022.05 19 |


සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

**<u>2023 වර්ෂය සඳහා ආදායම් ඇස්තමේන්තු</u>**

රාජ්‍ය ආදායම් ඇස්තමේන්තු කිරීම, රැස් කිරීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශයන් ඇතුළත් රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 01/2015 හා 2015.07.20 දිනැති චක්‍රලේඛය සහ ඒ සඳහා කරනු ලැබූ සංශෝධන ඇතුළත් 2016.12.30 දිනැති රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 (V) පිළිබඳව සහ 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හා ඒ සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් 2020.10.14 දිනැතිව නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 03 හි සඳහන් උපදෙස් කෙරෙහි ඔබගේ අවධානය යොමු කෙරේ.

02. පහත අංක 03 ඡේදයේ දක්වා ඇති ආදායම් සංකේතාංක සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් කටයුතු කරනු ලැබේ. එකී ආදායම් සංකේතාංක යටතේ වන ආදායම් එකතු කිරීමේ වගකීම පැවරී ඇති ඔබ විසින්, එක් එක් ආදායම් සංකේතාංක යටතේ 2023 වර්ෂය තුල එකතු කිරීමට අපේක්ෂිත ආදායම් පිළිබඳ ඇස්තමේන්තු මු.රෙ. 85(1) , (2) ප්‍රකාරව හැකිතාක් තාත්විකව හා නිවැරදිව සකස් කර භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළයුතු වේ.

03. ඒ අනුව, පහත සඳහන් ආදායම් සංකේතාංක යටතේ 2023 වර්ෂය සඳහා ඔබ ආයතනය මගින් එකතු කිරීමට අපේක්ෂිත ආදායම් පිළිබඳව ඇස්තමේන්තු මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍ර අංක TOD/REV/03 අනුව සකස් කර 2022.06.17 දින හෝ ඊට පෙර **<u>dasanayake.drr@tod.treasury.gov.lk</u>**/**<u>fernando.jh@tod treasury.gov.lk</u>.** යන විද්‍යුත් ලිපිනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

| <u>සංකේතාංකය</u> | <u>විස්තරය</u> |
|---|---|
| 20.02.01.99 | රජයේ වත්කම් වලින් ලැබෙන ආදායම - කුලී - අනෙකුත් කුලී |
| 20.02.02.99 | පොලිය - අනෙකුත් |
| 20.03.01.00 | විකුණුම් සහ ගාස්තු - දෙපාර්තමේන්තුමය විකිණීම් |
| 20.03.02.99 | විකුණුම් සහ ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් - විවිධ |
| 20.03.03.02 | විකුණුම් සහ ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම් - අනෙකුත් |
| 20.03.99.00 | විකුණුම් සහ ගාස්තු - අනිකුත් ලැබීම් |
| 20.05.99.00 | වර්තන පැවරීම් - ජාතික ලොතරැයි මණ්ඩලය හා අනෙකුත් පැවරුම් |

04. මේ සම්බන්ධව තවදුරටත් පැහැදිලි කිරීම් අවශ්‍ය වන්නේ නම් 0112484748 දුරකථන අංකයෙන් මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ(ආදායම්) අමතන්නේ නම් මැනවි.

එච්.සී.ඩී.එල්.සිල්වා
අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

පිටපත් :- 01. විගණකාධිපති
02. රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල්

( ආකෘති පත්‍ර අංක. TOD/REV/03 )

# වසර 2023 සඳහා ආදායම් ඇස්තමේන්තු

(i) ව්‍යවස්ථාව/ අධිකාරිය : ( අදාල නීති රීති හෝ චක්‍රලේඛ උපදෙස් )

(ii) අදාල අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව හෝ ආයතනය :- වැය ශීර්ෂ අංකය :-

(iii) ආදායම් අයිතමය :-

(iv) ආදායම් සංකේතාංකය :-

| විස්තරය | ආදායම | ඇස්තමේන්තු ආදායම 2022වර්ෂය | | | වසර 2023 සඳහා ඇස්තමේන්තු කළ ආදායම් | පුරෝකථන | | 3 වන සහ 4 වන තීරු අතර වෙනස පිළිබඳව හේතු | 4 සහ 6 වන තීරු අතර වෙනස (වැඩිවීම හෝ අඩුවීමට හේතු ) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2021 | මූලික ඇස්තමේන්තුව | සංශෝධිත ඇස්තමේන්තුව | 2022. 05. 31 දිනට සත්‍ය ආදායම | | 2024 | 2025 | | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | | |
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) | (10) |
| | | | | | | | | | |

( 9 හා 10 තීරු සඳහා වලංගු හේතුන් අනිවාර්යයෙන්ම සඳහන් කල යුතුය. )

නිවැරදි බවට සහතික කරමි

දිනය :-

.......................................................................

ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/දිස්ත්‍රික් ලේකම්

( නිල මුද්‍රාව )